**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**දෙවන වාරය - මැයි - සතිය - 04**

**විෂය-නර්තනය**

**ශ්‍රේණිය-9**

**සැකසුම:-එම්.කේ.සී දිල්රුක්ෂි මිය**
**ර/නිවි/ලෝකදෙණිය විද්‍යාලය, කරවිට**

Weekly School Department of Education, Sabaragamuwa Province

**1.පාඩම හෝ ඒකකය :-** 2.5.1 **වන්නම්/සිංදු වන්නම් නර්තනය කරමු.**

උඩරට නර්තන සම්ප්‍රදාය

**2.ශිෂ්‍යා කළ යුතු කාර්යන් :-**

- පළමුවෙන්ම නර්තන අධ්‍යනය කරන්න.ඒ සඳහා පහත Link භාවිතා කරන්න.
- කියවීම් පත්‍රිකාවට අදාල උපදෙස් සටහන් කරගන්න.
- දක්වා ඇති නාද මාලා අනුව ගායනයට හුරු වන්න.
- කිහිප වරක් නිවැරදි නාද මාලා අනුගමනය කරමින් දුර්වලතා මග හරවා ගත හැකියි.
- ඉන් පසුව 08 ශ්‍රේණියට අදාල වන්නම නර්තනය කරන්න.
- 09 ශ්‍රේණියට අදාල වන්මේ නාද මාලා පුහුණු වී පද පුහුණු වන්න.
- කස්තිරම නිවැරදිව පුහුණු වන්න.(පහත link භාවිතා කරන්න.)

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් ,website ,LMS ,පාඩම් හා ඉගෙනුම් ආධාරක :-**

- **e-තක්සලාව- 09 ශ්‍රේණිය**
- **e-නැණපියස :- 09 ශ්‍රේණිය නර්තනය**
- **you Tube- පහත දැක්වෙන link යොදා ගන්න.**

**<u>නර්තන පුහුණු වීම සඳහා</u>**

**වෛරෝඩි වන්නම :-** https://youtu.be/xvt8EO-4YjE

**සිංහරාජ වන්නම :-** https://youtu.be/VvPodHgvDhs

- **කියවීම් පත්‍රිකාව :-**

**<u>වෛරෝඩි වන්නම</u>**

**කස්තිරම :-**
රුඳ ගත ගත ගත කුකුඳත්
ගජින්ත ගත් ජිත් කුංදත්
තකුද ගජිං තකුද ගජිං
තකුද ගතට ගත කුද කුද
ගජිංත ගත් ජිත් කුංදත්
ජිකුතක තරිකිට කුංදත් තා

**සීරුමාරුව :-**
තකට දොදොං තා තුංදත් තරිතිට
තකට දොදොං තා

**අඩවුව :-**
ගත්ත තෙහිගු තකට තකුද
තක්කඩ ජික්කඩ කඩතක තකට තකුද
ගතකු තෙහිගු තකට තකුද
තත්- තත්කඩ තරිකිට ජිත් ජික්කඩ තරිකිට
තොං - තොංකඩ තරිකිට නං



## සිංහරාජ වන්නම

**තිත** :-මාත්‍රා 4 මහ තනි තිත

**බෙර පදය** :-දෙදොංත තකු දොං

**තානම** :-තනාත් තනෙන තම් දනත් තනෙන තම්

දනත් තනෙන තම් දන තා-නා-තන

තනාත් තනෙන තම් දනත් තනෙන තම්

දනත් තනෙන තම් දන තා-නා



**කවිය** :-පෙරත් කලෙක සිහ රජෙක් වැටුණි මහ

ළිඳක් තුළට ඉබි ලඩෙක් කරපු වැඩ

හැරත් මෙහෙම යස වැඩක් වුණේ නැත

චිරත් කලෙක පැවතුමත් යසයි හැඩ

දුරත් බැලුව නොව ලඟත් බලන අය

එටත් එලෙස වෙයි කැටත් තබම් දඬ

වටත් අයට දැනෙනටත් කියම් මම

රටක් වටින සිහ රජ වන්නෙමෙ හැඩ

**කස්තිරම** :-තකට තකට තක තරිකිට කුංදත් ///

රුංතක ජිංතක ජිංතක ජිං කුඳ///

තාග්ග ජිංතක තරිකිට කංදත්//

රුංතක ජිංතක තරිකිට කුංදත් තා

- **පොත් පත් /සඟරා**
  අතිරේක කියවීම් අත්පොත(ජාතික අධ්‍යාපන ආයතනය)
  ඥානසිරි පීරිස් මහතාගේ 9 ශ්‍රේණිය නර්තනය කෘතිය

**4.මෙම සතිය තුළ නියමිත පාඩම් වලින් ලබාගත යුතු ඉගෙනුම් ඵලඃ-**

- 08 ශ්‍රේණියේ දී උගත් වන්නම සම්පූර්ණයෙන් ම නර්තනය කරයි.
- අදාල කවි තාල තබමින් ගායනය කරයි.
- අදාළ තිත් රූපයට අනුව පද නටයි.
- නිවැරදි අංගහාර යොදා ගනිමින් නර්තනයේ යෙදෙයි.
- සිංහරාජ වන්නමේ කස්තිරම තාල තබා  කියයි.
- සිංහරාජ වන්නමට අදාල කස්තිරම බෙර වාදනයට අනුව නටයි.

**5.ඇගයීම/තක්සේරුකරණ ක්‍රමවේදඃ-**

1. 08 ශ්‍රේණියේ උගත් වන්නම සම්පූර්ණයෙන් නර්තනය කරයි.

2. 09 ශ්‍රේණියට අදාළ වන්නමේ කවි තාල තබමින් කියන්න.

3. අදාළ වන්නමේ පද නර්තනය කරන්න.

4.කස්තිරම තාල තබමින් කියන්න.

5.කස්තිරම බෙර වාදනයට අනුව නර්තනය කරන්න.

********